www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද මහ බැංකුව වෙලඳපොලවලට යලිසහතික දෙයි රැකියා විරහිතයින්ට කිසිදු සහනයක් පොරොන්දු නොවෙයි

## US Federal Reserve reassures markets, offers no help to the unemployed

**බැරී ග්‍රේ විසිනි**

**2010 අගෝස්තු 11**

එක්සත් ජනපද ආර්ථිකයේ වර්ධනය මන්දගාමී වන බව පිලිගන්නා ෆෙඩරල් මහ බැංකුව අද දිනයේ මූල්‍ය වෙලඳපොල ඒත්තුගැන්වීමට තැත් කල ද නරක අතට හැරෙන රැකියා අර්බුදය විසඳීමට කිසිදු බැරෑරුම් පියවරක් ගැනීමට අසමත් විය.

වොෂින්ටන් දිස්ත්‍රික්කයේ එක් දින රැස්වීමක් නිමා කරමින් මහ බැංකුවේ ප්‍රතිපත්ති තීරනය කරන ෆෙඩරල් විවෘත වෙලඳපොල කමිටුව නිවේදනය කලේ, තමන් සතු කල්පිරෙන උකස් නය, උකස්කර පිටුබලය සහිත සුරැකුම් හා භාන්ඩාගාර බිල්පත් වල මුදල්, ඩොලර් ට්‍රිලියන 2.3 වන එහි ශේෂ පත්‍ර වගකීම් පහත හෙලීම සඳහා යොදාගන්නවා වෙනුවට අලුතින් භාල්ඩාගාර බිල්පත් මිලට ගැනීමට යොදාගන්නා බවයි.

මහ බැංකුව, නිවාස වෙලඳපොල සක්‍රීයව තබාගැනීම සඳහා මුදල් නෝට්ටු අච්චුගැසීමට සමාන "ප්‍රමානාත්මක ලිහිල්කිරීම්" ලෙස තමන් හඳුන්වන මේ ප්‍රතිපත්තිය යටතේ ෆැනී මේ හා ෆ්‍රෙඩී මැක් යන රජයේ උකස් ආයතන විසින් පිටුබලය සපයන භාන්ඩාගාර හා උකස් බැඳුම්කර මිලට ගැනීමට සූදානම් බව එක එල්ලේ කියා නොසිටියේය.

පොලී අනුපාතිකයන් "දිගු කලක් යනතෙක් සුවිශේෂී වූ පහත මට්ටමක" පවත්වාගෙන යන්නේ යයි 2009 මාර්තුවේ සිට මතුරන මන්තරය පුනරුච්චාරනය කරමින් ෆෙඩරල් මහ බැංකුව සිය කෙටිකාලීන නය දීමේ පොලිය බිංදුවේ සිට සියයට 0.25 දක්වාවූ අනුපාතයකින් පවත්වාගන්නා බව කියා සිටියේය.

විරැකියාව සැලකිය යුතු තරමින් පහත හෙලීමට තුඩු දිය හැකි කිසිදු වෙනස් පියවර ගැනීමකින් තොරව, අතිරේක ද්‍රවශීලතාවය වෙලඳපොලවල් තුලට පොම්ප කරන බවටත්, මුලුමනින්ම පාහේ පොලී රහිත නය සඳහා ප්‍රධාන මූල්‍ය සමාගම්වලට ඉඩකඩ පවතින බවටත්, ෆෙඩරල් මහ බැංකුව මෙම පියවර මගින් වෝල් වීදියට සහතික විය. ඔබාමා පාලනාධිකාරයේ ප්‍රතිපත්ති තුලින් හරිහම්බ කරගත් එක්සත් ජනපද සමාගම් ප්‍රධානකොටම වැටුප් කප්පාදුව, වැඩ වේගවත් කිරීම හා දොට්ටදැමීම්වල ස්වරූපයෙන් සිදුකල රුදුරු වියදම් කැපීමේ පදනම මත මේ අවුරුද්දේ තියුනු ලෙස ඉහල නැගි ලාභ වාර්තා කර තිබේ. ඔවුහු කම්කරුවන්ගේ සේවා හා ජීවන තත්වයන් මත එල්ල කල මෙම ප්‍රහාර ඉවසා සිටීමට ඔවුන්ට බලකෙරෙන මුගුරක් ලෙස මහා විරැකියාව යොදාගත්හ.

ආර්ථිකය පිලිබඳව අඳුරු චිත්‍රයක් අඳිමින් නිකුත්කල එවන් ප්‍රකාශන පෙන්නුම් කරන්නේ වෙලඳපොල කොමිසම සිය වාර්තා නොසඟවා ඉදිරිපත්කොට ඇති බවයි. එය ආරම්භ කරන්නේ, තමන් ජූනි මාසයේ පවත්වන ලද අවසන් රැස්වීමෙන් පසුව "නිමැවුමේ හා සේවා නියුක්තියේ ප්‍රකෘතිමත්වීමේ පරාසය මෑත මාසවලදී මන්දගාමී වී" ඇති බව නිගමනය කරමිනි. පරිහානිගතවීමේ අනෙකුත් සලකුනු අතර "නව නිවාස ඉදිකිරීම් බලාපොරොත්තු සුන් කරන මට්ටමක පවතියි. බැංකු නය දීම් හැකිලෙමින් තිබේ." එය ඊලඟට සඳහන් කරන්නේ "ආර්ථිකය ප්‍රකෘතිමත්වීමේ" අවකාශය "ආසන්න ඉදිරි කාලයේදී අපේක්ෂා කරනවාට වඩා හොඳ අතට හැරීමට ඉඩ ඇති" බවයි.

සරල වචන වලින් කිවහොත් මෙහි අර්ථය වන්නේ, මහා අවපාතයෙන් පසුව එලඹි නරකම ආර්ථික හා සමාජ අර්බුදයෙන් කිසිදු ඉස්පාසුවක් නොමැති බවත් විරැකියා අනුපාතිකය තව දුරටත් ඉහල යාමේ හැකියාව පවතින බවත්ය.

මහ බැංකුවේ ගිනුම්වලට ඇතුලත් ඩොලර් ට්‍රිලියන 2 පමන වන මුලු එක්සත් ජනපද සුරැකුම්වලින් ඊලඟ වසර තුල කල් පිරෙන්නේ බිලියන 130 වන එය සතු සුරැකුම් ප්‍රමානයක් පමනක් බවත් එය යලි ආයෝජනය කරනු ඇති බවත් සඳහන්වේ. එම ප්‍රමානය මූල්‍ය වෙලඳපොලවල් මත කෙලින්ම ඇති කරනු

ඇත්තේ සුලු බලපෑමකි. නිෂ්පාදනය, රැකියා සම්පාදනය හා පරිභෝජනය මත ඇතිකරනු ඇත්තේ ඊටත් වඩා සුලු බලපෑමකි. මෙම පියවර නිවේදනය කිරීමේ ප්‍රධාන අරමුන වන්නේ "එකවර දෙපසකින්" පහරදෙන පසුබෑම හෝ වැඩෙන අවධමනය කරා පසුබැසීම පිලිබඳ හැකියාව සහිත වඩාත් තියුනු පියවර සඳහා මහ බැංකුව සූදානම් වන බව ඇඟවීම විය හැක.

*සීඑන්එන් මනි ඩොට් කොම් වෙබ් අඩවියට* අනුව කැපිටල් ඉකොනොමික්ස්හි පෝල් ඇෂ්වර්ත් කියන පරිදි මහ බැංකුවේ පියවර වනාහි "ආර්ථිකය උත්තේජනය කිරීමට වඩා වෙලඳපොලවලට සහතික වීම සඳහා සැලසුම්කල බොහෝකොටම නාමමාත්‍ර ඇඟවීමකි."

වෙලඳපොල කොමිසමේ රැස්වීම පැවැත්වුනේ, කම්කරු දෙපාර්තමේන්තුව විසින් 131,000 ක ශුද්ධ රැකියා අහෝසිවීමක් පෙන්වූ ජූලි මාසයේ අඳුරු සේවා නියුක්ති වාර්තාව නිකුත් කිරීමෙන් සිව් දිනකට පසුවය. රක්ත හීනතාවය පෙන්නුම්කල පෞද්ගලික අංශයේ රැකියා 71,000 ක් නිර්මානය වීම, දොට්ට දැමුනු තවත් 181,000 කම්කරුවන් අධෛර්යයට පත්ව රැකියා සෙවීම අතහැර දැමීම නිසා පමනක් නිල විරැකියා අනුපාතිකය අඛන්ඩව සියයට 9.5 රැඳී තිබීම වාර්තාවීමෙන් පසුවය.

සතිය ආරම්භ වූයේ අර්බුදයේ ගැඹුර හා පසුගිය මාස ගනනාවක ආර්ථික වර්ධනය දැඩි පසුබෑමකට ලක්ව තිබීම පෙන්නුම් කල ආර්ථික වාර්තා රැසක් නිකුත්වීමත් සමග ය. සඳුඳ දිනයේ වානිජ්‍ය දෙපාර්තමේන්තුව වාර්තා කලේ සියලු නාගරිකයන් තුලම පාහේ පුද්ගල ආදායම් පහත වැටුනු බවත්, ඉහල ගියේ ජනගහනය මිලියනයකට වැඩි නාගරිකයන් 52 න් 5 ක පමනක් බවත් ය. ආදායමේ වර්ධනයක් වාර්තාවූ බොහෝ තැන්වලදී එයට හේතු වූයේ මධ්‍යම ආන්ඩුවේ හා මිලිටරියේ සේවා නියුක්තිය ඉහල සංයුතියක් දැරීමයි. මෙම තැන්වල පෞද්ගලික සහන ගෙවීම් පහත වැටී තිබේ. වෙලඳ දෙපාර්තමේන්තුවට අනුව සමස්තයක් වශයෙන් පෞද්ගලික අංශයේ වැටුප් 2009 වසර තුල සියයට 6කින් පහත වැටුනි.

අඟහරුවාදා කම්කරු දෙපාර්තමේන්තුව වාර්තා කලේ වාර්ෂික අනුපාතයකට අනුව මෙම වසරේ දෙවන කාර්තුව තුල ශ්‍රම පලදායිත්වය අනපේක්ෂිත පරිදි සියයට 0.9 න් පහත වැටී ඇති බවයි. එය 2008 අවසානයේ පටන් ශ්‍රම පලදායිතාවයේ වැටීමක් වාර්තාවූ පලමු අවස්ථාවයි. අර්ථශාස්ත්‍රඥයින් බලාපොරොත්තු වූයේ පලමු කාර්තුව තුල සිදුවූ සියයට 3.9 ක වර්ධනයත් සමග දෙවන කාර්තුවේ ද හොඳ වැඩිවීමකි.

පිරිහීම ඇඟවුම් කරනවා ඇත්තේ වඩ වඩාත් අඩු කම්කරු සංඛ්‍යාවකගෙන් වඩ වඩාත් ඉහල නිෂ්පාදනයක් උපුටා ගැනීමට හාම්පුතුන්ට හැකියාව ගෙනදෙන ඉහල තුඩකි. එහෙත් කම්කරු දෙපාර්තමේන්තු වාර්තාවට ඇතුලත් වැටුප් හා කම්කරු පිරිවැය සංඛ්‍යා පෙන්නුම් කලේ කම්කරු වැටුප් හා සහන මත එල්ල කෙරෙන ප්‍රහාරය නොකඩවා සිදුවෙමින් පවතින බවයි.

සැලසුම්කල සියයට 1.5 ට සාපේක්ෂව ශ්‍රම පිරිවැය වැඩිවූයේ යාන්තම් සියයට 0.2නි. එය වසරකට පසුව ශ්‍රම පිරිවැයේ සිදුවූ පලමු වැඩිවීමයි. වසරේ පලමු කාර්තුව තුල ඒකක ශ්‍රම පිරිවැය සියයට 3.7 න් කඩා වැටුනි.

පලමු කාර්තුවෙන් දෙවැන්නට පිවිසෙන විට පැයක වැටුප සියයට 0.7 න් පහත වැටුනි. වසරේ පලමු මාස තුන ඇතුලත සියයට 1.5 න් හැකිලුනු උද්ධමනයට ගැලපූ කම්කරු සහන, දෙවන කාර්තුවේදී නොවෙනස්ව පැවතුනි.

පලදායිතා වාර්තාව ගැන සඳහන් කරමින් බ්‍රීෆින් ඩොට් කොම් විශ්ලේෂකයා මෙසේ පැවසූ බව ඒඑෆ්පී මාධ්‍ය ලිවීය. "නිපදවන නිමැවුමේ ප්‍රමානය සමග ගත් කල මෙම සංඛ්‍යා පෙන්වන්නේ ආයතන ශ්‍රම අතිරික්තයකින් යුක්ත බවයි." ඔහු කියා සිටියේ බලාපොරොත්තුවිය හැකි හොඳම තත්වය විරැකියාව වත්මන් මට්ටමේ රැඳී පැවතීම බවයි.

බාක්ලේස් බැංකුවේ විශ්ලේෂක පීටර් නිව්ලන්ඩ් සඳහන් කලේ වාර්තාව පොදුවේ සමාගම් වලට ශුභ ආරංචියක් වූ බවයි. "මේ කාලයට ව්‍යාපාරවල ලාභ වැඩිවීම කෙරෙහි හොඳම පසුබිම ලෙස මෙය පවතින්නේය"

එසේම වෙලඳ දෙපාර්තමේන්තුව, ජූනි මාසය තුල බඩු තොගය අනපේක්ෂිත පරිදි සියයට 0.1 න් පහත වැටුනු බව අඟහරුවාදා වාර්තා කලේය. ව්‍යාපාරික සමාගම්, විකුනුම් පිලිබඳ ඔවුන්ගේ සැලසුම් පහත හෙලීමත් සමග තොග රැස්කිරීම් පිරිහී ගියේය. වසරක් තුල වාර්තාගත තියුනුම වැටීම සටහන් කරමින් ජූනි මාසයේ තොග අලෙවිය සියයට 0.7 කින් පිරිහුනු බව වාර්තාව පෙන්වාදෙයි. තොග මට්ටමේදී විකිනුම් එක දිගට පහත වැටුනු දෙවන මාසය එයයි.

එම්එෆ්ආර් හි එක්සත් ජනපද ප්‍රධාන අර්ථශාස්ත්‍රඥ ජොෂුවා ෂපිරෝ උපුටා දක්වමින් එෆ්ටී ඩොට් කොම් භාන්ඩ තොග වාර්තාව ගැන සඳහන් කලේ "ඉදිරිය දෙස බලන විට නිමැවුමේ පහත් වර්ධනය, වියදම් කැපීමේ දැඩි ප්‍රවිෂ්ටයක් වෙත සමාගම් දිගටම අවධානය යොමුකිරීමට පොලඹවයි. මෙය

සතුටුදායක ශ්‍රම වෙළඳපොල වර්ධනයකට ඇති බාධක වැඩි කරයි.”

ගෝල්ඩ්මන් සැක්ස් ප්‍රධාන අර්ථශාස්ත්‍රඥ ජෑන් හැට්සියස් 06 දින සඳහන් කලේ විරැකියාව 2011 වසරේ මැද වන විට සියයට 10 ට ලඟාවනු ඇති බවයි.

ස්වාධීන ව්‍යාපාර ජාතික සම්මේලනය ද මේ සතිය තුල වාර්තා කලේ ඉක්මන් ආර්ථික ප්‍රතිප්‍රාප්තියක් පිලිබඳ අපේක්ෂා බොඳවී යෑමත් සමග කුඩා ව්‍යාපාරයන්හි ශුභවාදය ජූලි මාසයේදී සිව් මසකට පසුව එහි පහතම තැනට ඇද වැටී ඇති බවයි.

විවෘත වෙළඳපොල කමිටුව රැස්වන අවස්ථාව වන විට ඔබාමා, පාසැල් සඳහා ඩොලර් බිලියන 10 හා සෞඛ්‍ය සේවා වෙනුවෙන් බිලියන 16.1 ද වශයෙන් ප්‍රාන්ත ආන්ඩු වලට මධ්‍යම රජයේ බිලියන 26.1 ක ප්‍රතිපාදන සම්පාදනය පිලිබඳ පම්පෝරිය සඳහා ධවල මන්දිරය තුල පැවති ඡායාරූපගත කිරීමට සම්බන්ධ වෙමින් සිටියේ ය. අධ්‍යාපන ලේකම් අර්නි ඩන්කන් එක් පසෙකිනුත් රැකියා අහිමිවීමේ තර්ජනයට මුහුනපා සිටින ගුරුවරුන් දෙදෙනෙක් අනෙක් පසිනුත් තබාගෙන ඔබාමා, ගුරුවරුන් හා අනෙකුත් රාජ්‍ය අංශයේ කම්කරුවන්ට මෙම නීතියෙන් සහන සැලසෙන්නේ යයි පෙන්වීමට වාචාල උත්සාහයක් දැරීය.

යථාර්තය නම් පූර්ව සැලැස්මෙන් යෝජනාකර තිබුනු අරමුදලින් අඩක් පමනක් මේ නීතිය මගින් ලබාදෙන අතර එය ප්‍රාන්ත හා පලාත් මට්ටමේදී ඇතිව තිබෙන දැවැන්ත අයවැය හිඟයන් අහලකට වත් කිට්ටු නොවනු ඇති බවයි. ප්‍රතිපලය වනු ඇත්තේ අතිරේකව තවත් ලක්ෂ ගනනක් දොට්ටදැමීම හා මූලික සමාජ අවශ්‍යතාවන්ගේ තියුනු කප්පාදුවකි.

මෙම නීති පත්‍රිකාවෙන් ඇත්ත වශයෙන්ම සිදු කෙරෙන්නේ පවුලකට අත්‍යවශ්‍ය ආහාර මිලට ගැනීම සඳහා පසුගිය වසරේ උත්තේජක පැකේජයෙන් වැඩිකල ප්‍රතිපාදන අවසන් කරමින් ආහාර මුද්දර දීමනා ඩොලර් බිලියන 11.9 න් කපා හැරීමයි. දුගී පවුල් වලට සහනයක් වූ ආදායම් බදු මත හිමිකරගත් නය අත්තිකාරම් ද එයින් අවලංගු කෙරෙයි.

© www.wsws.org